217

# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2023.11.29

වේලාව : ප.ව.2.00

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මූලාසනය : **ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)**

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | සිරිසෝම ලෙකුවිතාන මහතා | - | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප) |
| 05) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප) |
| 06) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප) |
| 07) | එල්.ඒ.කළුකපුආරච්චි මයා | - | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය(බ.ප) / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්( වැ.බ) (පාලන) |
| 08) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 09) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 10) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 11) | කේ.ආර්.අබේසිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 12) | පී.පී.විජේවීර මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 13) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 14) | පේෂලා අබේසූරිය මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2023.11.29 දින පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී එළඹි තීරණ පහත පරිදි වේ.

<table>
<tr><th>අනු අංකය</th><th>කාරණය</th><th>තීරණය</th><th>ක්‍රියාත්මක කිරීමේ බලධාරියා</th></tr>
<tr><td>01</td><td>ගුරු පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සම්බන්ධව</td><td>බස්නාහිර පළාත් පාසැල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට 2023.11.21 දින සිට සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වන ලදී.<br><br>එම සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ දී පැන නැගුණු ගැටළු සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර එම ගැටළු නිරාකරණය කර ගැනීමට දිනයක් හා වේලාවක් නියමකර අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවල සාමාජිකයින් හා සභාපතිවරුන් කැඳවීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>තවද ගුරුවරුන් බඳවා ගැනීමේ විභාග පැවැත්වීම හා සම්මුඛ පරීක්ෂණ සම්බන්ධව ඉදිරිපත් වී ඇති විරෝධතා හා අධිකරණ ක්‍රියා මාර්ග සම්බන්ධව සාකච්ඡා කළ අතර පවතින ගැටළු නිරාකරණය කරගෙන දෙසැම්බර් මස මුල් සතියේදීම පත්වීම ලබා දීමට කටයුතු කරන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත දන්වන ලදී.</td><td>ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව</td></tr>
<tr><td>02.</td><td>බහු කාර්ය සංවර්ධන සහයකයින් PL2 PL3 කාණ්ඩයට ඇතුලත් කිරීම සම්බන්ධව</td><td>බහු කාර්ය සංවර්ධන සහයකයින් PL2 හා PL3 කාණ්ඩයට ඇතුලත් කර විදුලි කාර්මික හා රියදුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද බවත් , ඒ අනුව රියදුරු පුරප්පාඩු 243 ක් පමණ පවතින නමුත් ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වී ඇත්තේ 73 දෙනෙකු පමණක් බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් කරුණු දක්වන ලදී.<br><br>ඒ අනුව මෙවන විට රියදුරු පුරප්පාඩු පිරවීමේදී අත්‍යාවශ්‍ය ආයතනවල පුරප්පාඩු පිරවීමට මූලිකත්වය ලබා දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.</td><td>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු)</td></tr>
<tr><td>03</td><td>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව</td><td>2023 වර්ෂයේ අමාත්‍යාංශ මට්ටමින් ප්‍රතිපාදන වෙන් කිරීමේ වර්තමාන ප්‍රගතිය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් ඉදිරිපත් කරන ලදී.<br><br><table>
<tr><th>අමාත්‍යාංශය</th><th>මූල්‍ය ප්‍රගතිය</th><th>භෞතික ප්‍රගතිය</th></tr>
<tr><td>පළාත් පාලන අමාත්‍යාංශය</td><td>69.64%</td><td>89.49%</td></tr>
<tr><td>සෞඛ්‍ය අමාත්‍යාංශය</td><td>61.12%</td><td>82.25%</td></tr>
<tr><td>අධ්‍යාපන අමාත්‍යාංශය</td><td>62.47%</td><td>87.44%</td></tr>
<tr><td>කෘෂිකර්ම අමාත්‍යාංශය</td><td>59%</td><td>85%</td></tr>
<tr><td>ප්‍රවාහන අමාත්‍යාංශය</td><td>60%</td><td>84.64%</td></tr>
</table>අධ්‍යාපන අමාත්‍යාංශයේ පරිපූරක මගින් ලබා දුන් ප්‍රතිපාදනවල මූල්‍ය ප්‍රගතිය අවම මට්ටමක පවතින බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් ලැබුණු ප්‍රතිපාදනවල මූල්‍ය ප්‍රගතියෙහි අඩුවක් පවතින බවත් , ප්‍රවාහන අමාත්‍යාංශයේ පරිපූරක මගින් ලබා දුන් ප්‍රතිපාදන ඉතිරිව ඇති බවත් සාකච්ඡා කරන ලදී.</td><td>සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්</td></tr>
</table>



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| | | ඒ අනුව 2023 වර්ෂයට අදාළ සියලුම ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ නිරන්තර අධීක්ෂණ හා පසුවිපරම් කටයුතු සිදු කරන ලෙසත් 2023.12.13/14 යන දිනවල සියලුම ලේකම්වරුන් සමඟ සාකච්ඡා කරන ලෙසත් 2023.12.15 දින වන විට සියලුම ව්‍යාපෘති නිම කල යුතු බවටත් ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>එමෙන්ම 2024 ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු සඳහා පුවත්පත්වල දැන්වීම් පලකිරීමට සියලුම අමාත්‍යාංශ වලින් පූර්ව ප්‍රසම්පාදන වාර්තාවක් ලබා දෙන ලෙසට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් දන්වන ලදී.<br><br>තවද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා දුන් සැනින් ඇස්තමේන්තු ලබා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br><br>මේ වන විට ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතින් වන සමූපකාර සහකාර කොමසාරිස් කාර්යාලයේ (කොළඹ) ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ,තලංගම රෝහලේ 4,5 මහල්වල වැඩ නිම කිරීම , ඩඩ්ලි සේනානායක විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු , වතුපිටිවල රෝහලේ වායු සමීකරණ පද්ධතිය සකස් කිරීම , ළඟම පාසැල හොඳම පාසැල වැඩසටහනට අදාළ ඉතිරි ඉදිකිරීම් කටයුතු, දොම්පේ පැරකුම් විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු , වීදියගොඩ ආයුර්වේද රෝහලේ ඉදිකිරීම් ,2024 ජනවාරි මාසයේදීම අරම්භ කිරීමට කටයුතු කරන බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදුකරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සමබන්ධීකරණ හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල එකඟතාවය ලැබිය යුතුය.තවද ව්‍යාපෘති සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යවන ලිපිවල වගකීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් බාරගත යුතු බවට තීරණය කරන ලදී.<br>ප්‍රාදේශිය සම්බන්ධීකරණ හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල ව්‍යාපෘති සඳහා සෘජු ප්‍රතිපාදන ලබා දීමේදී මෙන්ම සැලසුම් අංශය මඟින් අනුමතිය ලබා දෙන සියලුම ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දීමේ ආකෘතියේ කෙටුම්පතක් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කල යුතු බවට තීරණය කරන ලදී.<br><br>අධ්‍යාපන හා සෞඛ්‍ය අමාත්‍යාංශවලට අයත් අනතුරුදායක ගොඩනැගිලි සීමිත මිල ගණන් කැඳවීමකින් සක්‍යතා වාර්තාවක් මඟින් ඉක්මනින් වැඩ නිමකල යුතු බවට සනාථ කර ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන සතියක් ඇතුලත වැඩකටයුතු ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.යම් හේතුවකින් අනතුරක් සිදුවුව හොත් ඊට අදාළ වගකිවයුතු නිලධාරීන් වගකීමට බැඳෙන බවද වැඩි දුරටත් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් / ඉංජිනේරු) |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 04 | කාර්ය සාධන තරඟාවලිය | කාර්ය සාධන තරඟාවලියට අදාළව බස්නාහිර පලාත් අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු, හා ආයතන 387 කට අදාළව විනිශ්වය කටයුතු සිදු කරමින් පවතී.ඒ අනුව මේවන විට ආයතන 317 ක විනිශ්වය කටයුතු සිදුකර ඇති අතර 255 ක ප්‍රතිඵල ලැබී ඇති බවත් ආයතන 62 ක ප්‍රතිඵල ලැබීමට ඇති අතර තවත් ආයතන 70 ක විනිශ්වය කටයුතු සිදු කරමින් පවතින බවත් 2023.12.04 දින වන විට සියලූම විනිශ්වය කටයුතු නිම කොට ජයග්‍රහයකයින් තේරීමට කටයුතු සිදු කරන බව වැඩ බලන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br><br>ඒ අනුව මෙම තරඟාවලියේ සහතික ප්‍රධානෝත්සවය 2023.12.20 දිනය පැවැත්විමට කටයුතු කරන අතර , එදිනම වෙබ් අඩවි තරඟාවලිය සඳහාද සහතික ලබා දීමට කටයුතු කරන බව වැඩි දුරටත් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05 | බස්නාහිර පළාත් සභාවට අයත් කාර්යාල පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය තුල ස්ථාපිත කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් කුළී පදනම මත පවත්වාගෙන යන ආයතනවන ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මේ වන විට බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති අතර ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරිම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකරමින් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු දක්වන ලදී.<br><br>ඒ අනුව ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් සභා ගොඩනැග්ල්ලෙහි ස්ථාපිතව ඇති බවට ප්‍රාදේශිය ලේකම්වරුන් හා අදාල සියලූ නිලධාරීන් විධිමත් පරිදි දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් , සියල්ලන්ගේම දැනුවත් වීම පිණිස පිවිසුම් පරිශ්‍රයෙහි දැන්වීම් පුවරුවෙහි ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නම ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 06 | ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ සමුළුව සම්බන්ධව | ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ සමුළුව 2023.12.01 දින පැවැත්වීමට කටයුතු සූදානම්ව පවතින අතර ඒ සමුළුව සඳහා සියලූම අමාත්‍යාංශ ලේකම්වරු හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු සම්බන්ධ වන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. තවද 2023 පෙබරවාරි මස පවත්වන ලද සමුළුවට අදාළ ප්‍රගතිය සාකච්ඡා කිරිමට සූදානම්ව පැමිණෙන ලෙසද වැඩි දුරටත් උපදෙස් ලබා දෙන ලදී. | සියලූම අමාත්‍යාංශ ලේකම්වරුන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 07 | තොරතුරු මධ්‍යස්ථානය සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ මට්ටමින් සිදු කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු ලබා ගැනීම මූලික කරගෙන තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීමේ කටයුතු මේවන විට සිදු කරමින් පවතී.<br><br>සැලසුම් අංශයේ සේවය කරන මාධ්‍ය ඒකකයේ නිලධාරීන් එම තොරතුරු ඒකකයට අනුයුක්ත කරන ලෙසත් ව්‍යාපෘතියක් අනුමත කල විට එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර හා පසු තත්ත්වයට අදාළ ඡායාරූප මෙන්ම ව්‍යාපෘතිය සිදු කරන අතරතුර ලබා ගත් ඡායාරූප එකතුවක් එම තොරතුරු මධ්‍යස්ථානයේ තබා ගැනීමට එම මාධ්‍ය නිලධාරීන් වෙත ලිඛිතව රාජකාරී පැවරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 08 | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව නිලධාරීන් දැන්වත් කිරීමට සියලු තොරතුරු ඇතුලත්කර අත් පත්‍රිකාවක් සකස්කර ආයතනය දැනුවත් කිරීමට කටයුතු කල නමුත් ඒ සඳහා නිලධාරීන්ගෙන් සතුටුදායක මට්ටමේ ප්‍රතිචාරයක් ලැබී නොමැති බවට වැඩ බලන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී. මෙම කාර්ය ඉටුකිරීම සඳහා සියලුම ආයතන ප්‍රධානීන් /අංශ ප්‍රධානීන්ගේ දායකත්වය සක්‍රියව ලබා දීම වැදගත් බවද සඳහන් කරන ලදී.<br><br>නිලධාරීන්ගේ දැනුවත් භාවය අවම වීම මෙලෙස මන්දගාමී ස්වභාවයක් පෙන්නුම් කිරීමට මූලික හේතුවක් බවත් සියලු නිලධාරීන් මෙම රක්ෂණාවරණයේ ප්‍රතිලාබ ලබා ගැනීමේ ක්‍රමවේදය ශාස්තු අය කිරීමේ විස්තර පිළිබඳ දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. ඒ සඳහා සියලු ආයතන ප්‍රධානීන් /අංශ ප්‍රධානීන්ගේ සක්‍රීය දායකත්වය ලබා දීමටත් තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 09 | රාජ්‍ය සේවය වඩාත් කාර්යක්ෂම සේවාවක් බවට පත්කිරීම සම්බන්ධවයි | විවෘත හා වගකිවයුතු රජයක් රටතුල ස්ථාපනය කිරීම සඳහා රාජ්‍ය සේවය වඩාත් කාර්යක්ෂම ,ජනතාවාදී ප්‍රශස්ත සේවාවක් බවට පත්කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විවෘත හා වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ලබා දුන් උපදෙස් වලට අනුව කටයුතු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරු හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු දැනුවත් කරන ලදී.<br><br>තවද පාලන චක්‍රලේඛ අංක 7/2023 බස්නාහිර පළාත් සභාවට නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර තම අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන්ද මේ පිළිබඳ දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 10 | බස්නාහිර පළාතෙන් බැහැර යාම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා නිලධාරීන් බස්නාහිර පළාත් සභාවට අයත් වාහන වලින් පළාතෙන් පිටත යන අවස්ථාවලදී පූර්ව අනුමැතිය ලබා නොගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.<br><br>එවැනි අවස්ථාවකදී කිනම් හේතුවක් නිසා හෝ පළාතෙන් පිටත යාමෙන් පසු අනුමැතිය ඉල්ලීමට කටයුතු නොකරන ලෙසත් බැහැර යාමට පෙර අනුමැතිය ලබාගෙන පිටත් වීම නීත්‍යානුකූල හා ආරක්ෂා සහිත වන බවත් අනුමැතිය ලබා ගැනීමෙන් පසු බැහැර යාමට කටයුතු කල යුතු බවටත් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 11 | රටින් බැහැර යාමේදී අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව | නිලධාරීන් විදේශගත වීමේදී කිසිදු අවස්ථාවක පූර්ව අනුමැතියට යටත්ව රටින් බැහැර යාමට අනුමැතිය ලබා නොදෙන බවත් , අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි කල් ඇතිව ඉදිරිපත් කිරීමටත් , අනුමැතිය ලබා ගැනීමෙන් පසුව විදේශගත වීමට කටයුතු කරන ලෙසත් සියලුම දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 12 | ආපදා ණය නිකුත් කිරීම සම්බන්ධව | අපදා ණය ලබා ගැනීමෙන් පසු ණය මුදලින් කොටසක් අය වීමෙන් පසු නැවත ණය කොටසක් ලබා ගැනීමට නිලධාරීන් කටයුතු කරනු ලබයි.එසේ ලබා ගත් ඇතැම් ණය වාරික ගෙවීම් පහැර හැර ඇති අවස්ථාවන්හිදී අධිකරණ ක්‍රියාමාර්ග මඟින් අය කර ගැනීමට ඉදිරිපත් වන අවස්ථාවන් ඇත. නමුත් එවැනි අවස්ථාවල ලබාගත් ණය මුදල සඳහන් වන්නේ අවසන් වරට ලබා ගෙන ඇති කොටස පමණක් බැවින් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේදී පත්වන ගැටළු සම්බන්ධයෙන් ප්‍රධාන නීති නිලධාරී විසින් අවධානය යොමු කරමින් ගිවිසුම්ගත වීමේ දී මුළු ණය මුදල ඇතුලත් කිරීමේ අවශ්‍යතාව නීති නිලධාරී විසින් පැහැදිලි කරන ලදී. ඒ අනුව කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 13 | තොරතුරු වාර්තා ලබා ගැනීමට නිශ්චිත දිනයක් සඳහන් කිරීම සම්බන්ධව | යම් අමාත්‍යාංශයකින්, දෙපාර්තමේන්තුවකින් , ආයතනයකින් හෝ පුද්ගලයෙකුගෙන් යම් තොරතුරක් වාර්තාවක් ඉල්ලුම් කිරීමේදී එය නොපමාව වහාම ලබා දෙන ලෙස සඳහන් කරනු දක්නට ලැබේ. එසේ සඳහන් කිරීම ප්‍රායෝගික නොවන අතරම ඒ සඳහා සාධාරණ වන පරිදි නිශ්චිත දිනයක් සඳහන් කර එම දිනට පෙර තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලෙසත්, තම අමාත්‍යාංශ යටතේ පවතින සියළු දෙපාර්තමේන්තු හා ආයතන මේ සම්බන්ධව දැනුවත් කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු, |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

<table>
<tr>
<td>14</td>
<td>බස්නාහිර පළාත් සභාව සතු නිල නිවාස තොරතුරු යාවත්කාලීන කිරීම සම්බන්ධව</td>
<td>
බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු , හා ආයතන සතු මෙතෙක් ඉදිරිපත් වී ඇති නිල නිවාස තොරතුරු සම්බන්ධව වැඩ බලන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව,
<table>
<tr><th>අමාත්‍යාංශය</th><th>නිලනිවාස ගණන</th><th>තොරතුරු ඉදිරිපත්වී ඇති නිල නිවාස ගණන</th><th>තොරතුරු ඉදිරිපත්වී නැති නිල නිවාස ගණන</th></tr>
<tr><td>ප්‍රධාන ලේකම් කාර්යාලය</td><td>2</td><td>2</td><td>-</td></tr>
<tr><td>පළාත් පාලන අමාත්‍යාංශය</td><td>320</td><td>320</td><td>-</td></tr>
<tr><td>ප්‍රවාහන අමාත්‍යාංශය</td><td>13</td><td>13</td><td>-</td></tr>
<tr><td>ආණ්ඩුකාර ලේකම් කාර්යාලය</td><td>1</td><td>1</td><td>-</td></tr>
<tr><td>අධ්‍යාපන අමාත්‍යාංශය</td><td>448</td><td>87</td><td>361</td></tr>
<tr><td>සෞඛ්‍ය අමාත්‍යාංශය</td><td>313</td><td>88</td><td>225</td></tr>
<tr><td>කෘෂිකර්ම අමාත්‍යාංශය</td><td>77</td><td>77</td><td>-</td></tr>
<tr><td>ඉංජිනේරු කාර්යංශය</td><td>9</td><td>9</td><td>-</td></tr>
<tr><td>මුළු එකතුව</td><td>1183</td><td>597</td><td>586</td></tr>
</table>
ඒ අනුව නිල නිවාස 1183 ක් පවතින අතර තොරතුරු ඉදිරිපත්ව ඇතිතේ 597ක් වන අතර නිල නිවාස 586 ක තොරතුරු මේ දක්වා ඉදිරිපත් වී නොමැති බවට වැඩ බලන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ප්‍රකාශ කරන ලදී.
ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය අනුව බස්නාහිර පළාත් වත්කම් පැවරුම් සහතිකයක් මඟින් අත්පත් කරගෙන නොමැති අතර වත්කම් ගැසට් කිරීමට කටයුතු කරමින් පවතින නමුත් බස්නාහිර පළාත් සභාව සතුව පවතින 2000 ක පමණ වත්කම් වලින් සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් වී ඇතිතේ වත්කම් 59 ක පමණක් බව වැඩි දුරටත් කරුණු දක්වමින් ආණ්ඩුකාර ලේකම් විසින් කරුණු දක්වන ලදී. මෙම වත්කම් හිමි අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතන වත්කම් සම්බන්ධ අවබෝධයක් හෝ අවධානයක් නොමැති වීම මීට හේතුවී ඇති බව දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර මේ සම්බන්ධව වැඩි දුරට සාකච්ඡා කල යුතු බැවින් වෙනම සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය කරන ලදී.
</td>
<td>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු</td>
</tr>
<tr>
<td>15</td>
<td>ආරාධනා පත්‍ර සහතික පත්‍ර කෙටුම්පත් යොමු කිරීම සම්බන්ධව</td>
<td>ඇතැම් ආයතන විසින් සකස් කරන ලද ආරාධනා පත්‍ර , සහතික පත්‍ර ආදිය කෙටුම්පත් Whatsapp මාධ්‍ය හරහා යොමු කරන අතර එය ඉදිරියේදී සිදු නොකරන ලෙසත් එවැනි කෙටුම්පත්වල දෘඩ පිටපත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් අමාත්‍යාංශ යටතේ පවතින සියලු දෙපාර්තමේන්තු හා ආයතන දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.</td>
<td>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු</td>
</tr>
</table>



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 16 | මූලාා අංශයේ දැනුවත් කිරීම් සම්බන්ධව | ➢ මූලික විමර්ශන කඩිනමින් නියමිත පරිදි නිම කිරීමට කටයුතු කරන ලෙසත් , හානි හා පාඩු 2023.12.31 වන විට නිම කිරීමට කටයුතු කරන ලෙසත් අවසන් ගිණුම් තරඟාවලියට පිළිතුරු සැපයීමේදී මෙම කරුණු බලපාන බවත් නියෝජා ප්‍රධාන ලේකම් (මූලාා) විසින් කරුණු දක්වන ලදී.<br><br>➢ මාස හය ඉක්ම වූ චෙක්පත් තිබේදැයි බැංකු සැසඳුම් ලබාගෙන පරික්ෂා කර බලා ඒ සියල්ල 2023.12.31 දිනට පෙර අවසන් කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී.<br><br>➢ 2023 භාණ්ඩ සමීක්ෂණ කමිටු 2023.12.15 දිනට පෙර පත් කිරීමට කටයුතු කරන ලෙස දන්වන ලදී.<br><br>➢ 2024 ජනවාරි මස වන විටම නඩත්තු කටයුතු 50% කට සෑම ආයතනයක් විසින්ම වඩාත්ම සුදුසු ප්‍රමාණාත්මක නඩත්තු කටයුතු තෝරාගෙන ඒ සඳහා සූදානම් වන ලෙසත් දැනුම් දෙන ලදී.<br><br>• | සියලුම අමාතාාංශ ලේකම්වරු හා සියලුම නියෝජා ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත